**ශීර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියලු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 මැයි 25 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.18 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධානවලට අනුකූලව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සාරාංශගත කර පහත සඳහන් සටහනේ දක්වා ඇත.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | | **ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|---|
| මුදල් රෙගුලාසි 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම | 1. | ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබීම. | 2.3.1 |
| | | 2. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරය ඉටු නොකිරිම | 2.3.2(අ) |
| | | 3. | අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම. | 2.3.2(ආ) |
| | | 4. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම | 2.3.2(ඇ) |
| | | 5. | ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.3.2(ඈ) |
| | | 6. | ව්‍යාපෘති 82 ක් නිම කිරීමේ ප්‍රමාදය | 2.3.2(ඉ) |
| | | 7. | මුදල් නිදහස් කර තිබුණත්, ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති | 2.3.2.(ඊ) |

| | | | | |
|---|---|---|---|---|
| | | 8. | ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම. | 2.5.1 |
| | | 9. | අභ්‍යන්තර විගණන වැඩසටහන මගින් සියළු විගණන කටයුතු ආවරණය නොවීම | 2.17(අ) |
| | | 10. | කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ අඩුපාඩු | 2.18(ආ) |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | 1. | තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවා ගැනීමේ ප්‍රමාදය | 2.13(ආ) |
| | | 2. | තැන්පත් ගිණුමේ අඩුපාඩු | 2.14 |
| | | 3. | ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම. | 2.15 |
| | | 4. | අනුකූල නොවීම් | 2.16 |
| | | 5. | අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත් | 2.18(අ) |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | 1. | වත්කම් ලේඛනගත කිරීමේ අඩුපාඩු | 2.6.(අ) |
| | | 2. | වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා නොකිරීම | 2.6(ආ) |
| | | 3. | වාහනවල ඉන්ධන දහනයවීම පරීක්ෂා නොකිරීම | 2.6.(ඇ)(i) |
| | | 4. | වාහන අවභාවිතය | 2.6(ඇ)(ii) |

| | | | | |
|---|---|---|---|---|
| | | 5. | වාහන හා ඒවායේ උපකරණ පිළිබඳ පූර්ණ සමීක්ෂණයක් නොකිරීම | 2.6(ඈ)(iii) |
| | | 6. | පිරිවැය කාර්යක්ෂමතාවයකින් තොරව වත්කම් අපහරණය කිරීම | 2.6(ඈ) |
| | | 7. | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම් | 2.6(ඉ) |
| | | 8. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් කිරීමේ අඩුපාඩු | 2.6.(ඊ) |
| | | 9. | බාහිර පාර්ශවයන්ට දී ඇති වත්කම් | 2.6(උ) |
| | | 10. | වෙනත් පාර්ශවයන්ට අයත් වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම | 2.6(ඌ) |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | 1. | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරය වෙත පියවීමේ ප්‍රමාදය | 2.13(අ) |
| | | 2. | අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම | 2.17(ආ) |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව, | | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම යටතේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත්වීම | 2.12(අ) |

| | | | | |
|---|---|---|---|---|
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | 1. | ඉදිකිරීම්වල ගුණාත්මකභාවය අඩුවීම | 2.4(අ) හා (ආ) |
| | | 2. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු | 2.5.2 |
| | | 3. | කළමනාකරණ දූර්වලතා | 2.9 |
| | | 4. | මහජනයා වෙත සේවා සැපයීමේ දූර්වලතා | 2.10 |
| | | 5. | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් එවා ඇති ප්‍රතිපාදන උපයෝජනය කිරීමේදී වූ ඌනතා | 2.11 |
| 128(1)(ජ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව | | පාඩු හා හානිවීම් | 2.7 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරයන්

(අ). දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය ලෙස කටයුතු කිරීම.

(ආ). දිස්ත්‍රික්කයේ ආගමික හා සංස්කෘතික උරුමයන් සුරැකීමට කටයුතු කිරීම.

(ඇ). දිස්ත්‍රික්කයේ තිරසාර සංවර්ධනයක් කරා ගමන් කිරීමට අවශ්‍ය කටයුතු මෙහෙය වීම.

(ඈ). රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු කරගෙන යෑම.

(ඉ). ප්‍රාදේශීය ලේකම් කාර්යාල අධීක්ෂණය හා පරිපාලන කටයුතු කිරීම.

(ඊ). කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය.

(උ). දිස්ත්‍රික්කයේ ආපදා කළමනාකරණ කටයුතු මෙහෙය වීම.

(ඌ). විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් දිස්ත්‍රික්කය තුළ කරන කටයුතු මෙහෙයවීම.

(එ). ගිනි අවි හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරීම.

(ඒ). ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය කළමනාකරණ කටයුතු කිරීම

(ඔ). වත්කම් භාරකාරත්වය හා පාලනය තහවුරු කිරීම.

(ඕ). ජාතික මට්ටමේ උත්සව සංවිධානය කිරීම.

## 2.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන හා එමගින් ඉටු කළ යුතු කාර්යභාරයයන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ස්ථාපිත කර ඇති ආයතන හා ඒවායේ කාර්යභාරය පහත දැක්වේ.

| | දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ ඇති ආයතන | ස්ථාපිත කිරීමේ අධිකාරි බලය | කාර්යභාරය |
|---|---|---|---|
| (i) | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1992 අංක 58 දරන ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටුවීමේ පනත | මධ්‍යම රජයෙන් සහ පළාත් සභා වලින් පවරනු ලබන පරිපාලන හා සංවර්ධන කාර්ය භාරයන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම |
| (ii) | හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| (iii) | අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| (iv) | කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| (v) | වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |

## 2.3 කාර්යසාධනය

### 2.3.1 සැලැසුම් කිරීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත ආයතන 05 ක, අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ව්‍යාපෘතිය වෙන් වෙන් වශයෙන් දක්වා ව්‍යාපෘතිය ආරම්භ කිරීමට හා අවසාන කිරීමට අපේක්ෂිත දිනයන් හා ව්‍යාපෘති ඇස්තමේන්තු වටිනාකම් සඳහන් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan), ක්‍රියාත්මක කිරීමේ කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල (Output/ Outcome) ඇස්තමේන්තු කර සඳහන් කර නොතිබුණි.

**2.3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

**------------------------------------------------------------------**

ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන යටතේ දිස්ත්‍රික් ප්‍රජා මූල බැංකු 35 ක් ලාභදායි බැංකු බවට පත් කිරීම ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයක් වී තිබුණි. 2017 දෙසැම්බර් 31 දින වන විට ප්‍රජා මූල බැංකු 04 ක් එකතුව රු.මිලියන 5.25 ක් අලාභ ලබා තිබුණි.

**(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

**----------------------------------------------------**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන් සඳහා රු.700,000 ක ප්‍රතිපාදන සලසා නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් 10 ක් පැවැත්වීමට සැලැසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.570,000 ක් වැය කරමින් පුහුණු වැඩසටහන් 07 ක් පමණක් පවත්වා තිබුණි.

**(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

**------------------------------------------------------------**

ලංකා විදුලි බල මණ්ඩලයේ විදුලිය බිඳ වැටුණු අවස්ථාවක විදුලිය අඛණ්ඩව කාර්යාලයට ලබා ගැනීමේ අරමුණින් හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සූර්ය බලශක්ති පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 1.84 ක් වැය කර තිබුණි. නමුත් 2018 පෙබරවාරි 28 දින වන විටත් එම අරමුණ ඉටු කර ගෙන නොතිබුණි.

**(ඈ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

**------------------------------------------**

සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 8.18 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම ව්‍යාපෘති ආරම්භ කර තිබුණත්, කාලගුණ හේතු මත කාලය ප්‍රමාණවත් නොවීම නිසා එම ව්‍යාපෘති නිම නොකර අතහැර තිබුණි.

**(ඉ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

**-----------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී ගිවිසුම් අත්සන් කර තිබුණු රු.මිලියන 44.25 ක් වටිනා ව්‍යාපෘති 82 ක් ගිවිසුම්ගත වූ සැනින් වැඩ ආරම්භ නොකිරීම, අමුද්‍රව්‍ය සපයා ගැනීමේ අපහසුතා, ඉඩම් පවරා ගැනීම ප්‍රමාදවීම, අයහපත් කාලගුණය වැනි හේතූන් මත ගිවිසුම් කාලය තුළ නිම කර ගැනීමට නොහැකි වී තිබුණි. ඒ අනුව දින 01 ක සිට දින 125 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදකින් පසුව එම ව්‍යාපෘති නිම කර තිබුණි.

**(ඊ)** **මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

ඉදිකිරීම් සම්බන්ධව ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයට හා මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට සමාලෝචිත වර්ෂයේදී මුළු මුදලම නිදහස් කර තිබුණත්, එම ඉදිකිරීම් කටයුතු 2018 පෙබරවාරි 22 දින වන විටත් නිමකර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(i) අඹලියද්ද උඩ කොටසට ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ ප්‍රධාන ජලනළ මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය සඳහා හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 දෙසැම්බර් 20 දින රු.මිලියන 1.48 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත ගෙවා තිබුණත්, 2018 පෙබරවාරි 22 දින වන විටත් ව්‍යාපෘතිය නිමකර නොතිබුණි.

(ii) වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිවිසුම් මාර්ගය කාපට් ඇතිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දින රු.මිලියන 1.95 ක් මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි. 2018 මාර්තු 02 දින වන විටත් එම කර්මාන්තය ආරම්භ කර නොතිබුණි.

### 2.3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 ජූලි 01 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 2.4 දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දේශීය අරමුදල් යොදවා ව්‍යාපෘති 1451 ක් ක්‍රියාත්මක කිරීම සඳහා එකතුව රු.මිලියන 656.85 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 598.96 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 57.89 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 9 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. මේ සම්බනධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිවිසුම් මාර්ගයේ කැටගල් ඇල්ලීම සඳහා රු.මිලියන 6.10 ක් වැය කර තිබුණි. කැටගලක සම්මත උස 80 mm විය යුතු වුවද, එය 75 mm සිට 85 mm දක්වා විශාල පරාසයක විහිදී පැවතුණි. ගොඩනැගිලි සම්මත රේටයට අනුව 1 $m^2$ සඳහා රු.2,682 ක මුදලක් ගෙවීම් කර තිබුණු අතර, එම රේටයට අනුව කුට්ටි ගලක පළල 105 mm විය යුතු වුවද, එය 102 mm සිට 106 mm දක්වා පරාසයක විහිදී පැවතුණි. තවද, කැටගලක දිග 225 mm විය යුතු වුවද, එය 202 mm සිට 205 mm දක්වා පරාසයක විහිද පැවතුණු අතර, පැවතිය යුතු දිගින් යුතු එකම අන්තර් මූට්ටු කුට්ටි ගලක් (Interlock) හෝ ඉදිකිරීම සඳහා භාවිතා කර නොතිබුණි.

**(ආ)** හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රථවාහන අංගනය, ආපන ශාලාව හා එළිමහන් රංග පීය ගොඩනැගිල්ල රු.මිලියන 8.39 ක් වැයකර ඉදිකර තිබුණි. එම ගොඩනැගිල්ලේ භෞතික ප්‍රගතිය පරීක්ෂාවේදී ඉදිකිරීම් කටයුතු සඳහා මඩ සහිත ඉතා තුනී වැල්ලක් භාවිතා කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර එම වැලි ගොඩනැගිලි ඉදිකිරීම සඳහා යෝග්‍ය නොවන තුනී වැල්ලක් බව රසායනාගාර පරීක්ෂාවේදී තහවුරු වී තිබුණි. විගණන අවස්ථාව වන විට ඉටුකර

තිබුණු කපරාරු කොටස්ද මඩ පැහැතිව දිස්වූ අතර, ඒ අනුව කපරාරුව සඳහාද මෙම වැලි යොදා ඇති බව තහවුරු විය. ද්‍රව්‍ය මිලදී ගැනීමේදී රු.65,000 ක් වැලි සඳහා ගෙවීම් කර තිබුණු අතර මහියංගනයේ සිට වැලි ප්‍රවාහනය වෙනුවෙන් ආයතන 3කට රු.202,937 ක් ගෙවීම් කර තිබුණි.

## 2.5 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

-----------------------------------------------------------------

### 2.5.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම

----------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කර සැපයුම් හා සේවා ලබා ගැනීම සඳහා රු.මිලියන 65.35 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් රු.මිලියන 63.6ක් උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනය වෙනුවෙන් පිළියෙල කළ යුතු ප්‍රසම්පාදන සැලැසුම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ප්‍රසම්පාදන සැලැසුම් කිරීම සහ ප්‍රාරම්භක අවධිය**

-----------------------------------------------------

ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා සහ ආහාරපාන හා නිල ඇඳුම් සපයා ගැනීම සඳහා රු.මිලියන 10.05 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 9.85 ක් උපයෝජනය කර තිබුණි. එම ප්‍රතිපාදන උපයෝජනය කිරීම පිළිබඳ තොරතුරු පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අමාත්‍යාංශ 25 ක් ද, දෙපාර්තමේන්තු 22 ක් ද, ජනාධිපති හා අග්‍රාමාත්‍ය කාර්යාලවලින් රු.මිලියන 692.71 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදන උපයෝජනය කිරීම ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සිදු කළ යුතුව තිබුණත්, එම ප්‍රසම්පාදනයන් පිළිබඳ තොරතුරු ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

**(ආ) පූර්ව කොන්ත්‍රාත් අදියරය**

-------------------------------

ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන හා අවසන් කරන කාල වකවානු ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කර තිබුණි. නමුත් වැය විෂයයන් 5 ක් යටතේ සලසා තිබුණු රු.මිලියන 14 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු සැලැස්මේ සඳහන් කාල වකවානු තුළ ඉටු කිරීමට අපොහොසත් වී තිබුණි. එම කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදු කරමින් පැවැතුණි.

### 2.5.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

--------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේ දී ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය හා වෙළඳපොල මිල සැඳැහුම් ක්‍රමය යොදා ගන්නා බව ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් කර තිබුණි. නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදු කරන ලද ප්‍රසම්පාදන කටයුතු විනිවිදභාවයෙන් හා උපරිම තරඟකාරිත්වයකින් සුදුසු ලංසුව තෝරා ගැනීමේ ක්‍රමවේදයකින් තොරව රු.මිලියන 765.29 ක් වටිනා ප්‍රසම්පාදන 559 ක් ක්‍රියාත්මක කර තිබුණි. මේ නිසා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1:2:1(අ) හා 1.2.1(ඈ) මාර්ගෝපදේශවලින් බැහැරව කටයුතු කර තිබුණු බව අනාවරණය විය.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1 මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන අනුගමනය නොකර ප්‍රසම්පාදන 81 ක් සඳහා වන ලංසු අතින් ලබා ගෙන තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව අනුව දැන්වීම් පල කිරීම ආර්ථික වශයෙන් අවාසි සහගතවන අඩු වටිනාකමකින් යුත් නිතර භාවිතා කරනු ලබන අයිතම ප්‍රසම්පාදනය කිරීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කරගෙන ඔවුන්ගෙන් ලංසු කැඳවා ප්‍රසම්පාදනයන් සිදු කළ හැකිව තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් එම ක්‍රමවේදය අනුගමනය නොකර කාර්යාලය ආසන්නයේ පිහිටි වෙළෙඳසැල්වලින් රු.මිලියන 1.21 ක් වටිනා භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6 මාර්ගෝපදේශය ප්‍රකාරව පිරිවිතර සමාලෝචනය කිරීම හා අනුමත කිරීම, පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීමේ ලේඛන හා ලංසු කැඳවීමේ ලේඛන සමාලෝචනය කර අනුමත කිරීමද තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් සිදු කළ යුතුව තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ ප්‍රසම්පාදන කටයුතුවලදී එම අවශ්‍යතාවය ඉටුවන පරිදි ප්‍රසම්පාදන කටයුත්ත ආරම්භයේදී තාක්ෂණික ඇගැයීම් කමිටු පත්කළ යුතු වුවත්, එසේ නොකර ලංසු විවෘත කිරීමෙන් පසුව තාක්ෂණ ඇගැයීම් කමිටු පත් කර තිබුණි.

(ඉ) හඟුරන්කෙත ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රයේ පිවිසුම් මාර්ගය ඉදිකිරීම සඳහා රු.මිලියන 6.10 ක් වැය කර තිබුණි. අනුමත සමිති හා ICTAD GRADE 9 කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු කැඳවීමෙන් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කිරීමේ අවශ්‍යතාවයෙන් මිදීම සඳහා කොන්ත්‍රාත්තුව කොටස් හතරකට බෙදා කොන්ත්‍රාත්කරුවන් හතර දෙනෙකු මගින් ඉදිකිරීමේ කටයුත්ත ඉටු කර ගෙන තිබුණි.

(ඊ) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාල රථවාහන අංගනය, ආපන ශාලාව හා එළිමහන් රංග පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.මිලියන 8.39 ක් වැය කර තිබුණි. එම ගොඩනැගිල්ල ඉදිකිරීමේ ප්‍රසම්පාදන කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකළ යුතුව තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.14.1 මාර්ගෝපදේශයෙන් බැහැරව එම කොන්ත්‍රාත්තුව රු.මිලියන 2 කට අඩුවන පරිදි කොටස් කිහිපයකට වෙන්කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රසම්පාදන කටයුතු ඉටු කර කොන්ත්‍රාත්තු පිරිනමා ගිවිසුම්වලට එළඹ තිබුණි.

(උ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක් විසින් 2017 වර්ෂය වෙනුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කරගෙන තිබුණි. එම ලියාපදිංචි කිරීමේ කටයුතු අවසන් කළ දිනයට පසුව ලැබුණු තවත් අයදුම්පත් 63 ක් පිළිගෙන සමාලෝචිත වර්ෂයේදී එම සැපයුම්කරුවන්ගෙන් රු.මිලියන 12.18 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි.

(ඌ) අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් තීනියාගල ග්‍රාම නිලධාරි වසමේ ගිණිගත්හේන අලගල පහළ කොටස මාර්ගය සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 1.02 ක වටිනාකමකට පෞද්ගලික ආයතනයක් වෙත පිරිනමා තිබුණි. අදාළ ප්‍රසම්පාදන කටයුත්ත සඳහා වන තාක්ෂණික ඇගැයීම් කමිටුවේ වාර්තාවේ එක් සාමාජිකයෙකු පමණක් අත්සන් කර තිබුණි. තාක්ෂණික ඇගැයීම් කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කළ සැලසුම් සහකාර අධ්‍යක්ෂවරයා සහ සමෘද්ධි කළමනාකරුවෙකු වූ අනෙක් සාමාජිකයා තාක්ෂණික ඇගැයීම් කමිටුවේ රැස්වීම් සඳහා සහභාගී වී නොතිබුණි.

(එ) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 මාර්ගෝපදේශ ප්‍රකාරව ලංසු විවෘත කිරීම සම්බන්ධ ලේඛන පවත්වා නොතිබුණි.

(ඒ) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයක් ඉදිරිපත් නොකළ ආයතන 18 ක් සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි කර තිබුණි.

(ඔ) ආයතනවල වෙළඳ ලියාපදිංචිය අනුව ඔවුන්ගේ සාමාන්‍ය වෙළඳාම නොසලකා රු.250 ක් ගෙවා ඕනෑම ආයතනයක් ඕනෑම කාණ්ඩයක් යටතේ ලියාපදිංචි කිරීමට හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අවස්ථා 07 කදී කටයුතු කර තිබුණි.

(ඕ) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේ සහනාධාරලාභීන් සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන කමිටුව විසින් නියමිත භාණ්ඩය මිලදී ගත යුතු ආයතනය නිශ්චිතව සඳහන් කර ප්‍රසම්පාදන තීරණය සටහන් කර නොතිබුණි. අවම මිල යටතේ සුදුසු භාණ්ඩ මිලදී ගැනීමේ තීරණය පැහැදිලි නොවීම නිසා රජයට රු.189,495 ක මූල්‍යමය අලාභයක් සිදුවී තිබුණි.

(ක) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තිර රෙදි මිලදීගැනීම සඳහා 2017 අගෝස්තු 11 දින එක් පෞද්ගලික ආයතනයකින් ලංසු කැඳවා තිබුණි. 2017 දෙසැම්බර් මාසයේදී මේ සඳහා රු.499,850 ක් ගෙවා තිබුණද, විගණන දිනය වූ 2018 පෙබරවාරි 20 දින වන විටත් තිර රෙදි අදාළ කාර්යාලවල භාවිතයට ගෙන නොතිබුණි.

(ග) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 දෙසැම්බර් 31 දින තීන්ත මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන තීරණය අනුව ලංසු ඉදිරිපත් කර නොතිබුණු, ලියාපදිංචි සැපයුම්කරුවකු නොවූ පෞද්ගලික ආයතනයකට රු.177,425 ක් ගෙවා තීන්ත මිලදී ගෙන තිබුණි.

(ච) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු කැඳවීමේදී වර්ගය හා වෙළෙඳ නාමය සඳහන් නොකළ යුතු වුවත්, ඒ කෙරෙහි අවධානය යොමු නොකර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ගය හා වෙළඳ නාමය සඳහන් කර ලංසු කැඳවා රු.120,800 ක් වැය කර එම වෙළෙඳ නාමය යටතේ වූ ලැප්ටොප් පරිගණක මිලදී ගෙන තිබුණි.

## 2.6 වත්කම් කළමනාකරණය

-----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) වත්කම් ලේඛනගත කිරීම

---------------------------

2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වත්කම් පිළිබඳ තොරතුරු අදාළ ආයතන අනුව 2017 නොවැම්බර් 30 දින වන විට කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යැවිය යුතුව තිබුණි. එම තොරතුරු 2018 අප්‍රේල් 30 දින වන විටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දැනුම් දී නොතිබුණු අතර, ගොඩනැගිලිවල තක්සේරු කිරීම් කටයුතුද අවසන් කර නොතිබුණි.

**(ආ) රජය සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා නොකිරීම**

2015 ජනවාරි 01 දිනෙන් පසු කොන්ක්‍රීට් මාර්ගවල සනකම පරීක්ෂා කිරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදු කර නොතිබුණු අතර, රු.500,000 වැයකර මිලදී ගන්නා ලද පරීක්ෂණ කට්ටලය හා රු.166,915 ක කොන්ක්‍රීට් තල අනාරක්ෂිතව ගබඩාවක දිරාපත් වෙමින් පැවතුණි.

**(ඇ) වාහන උපයෝජනය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂය අවසන් වන විට පහත සඳහන් පරිදි වාහන 26 ක් පැවැති අතර, එම වාහනවලින් කිලෝ මීටර් 406181 ක් ධාවනය කර තිබුණි. ඒ සඳහා ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු.3,861,958 ක්ද, වාහන සේවා කිරීම සඳහා රු. 1,256,432 ක්ද, වාහන අළුත්වැඩියා සඳහා රු.4,656,894 ක්ද හා වාහන රක්ෂණය කිරීම සඳහා රු.1,520,844 ක්ද වශයෙන් එකතුව රු.11,296,126 ක් වැය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාහන ධාවනය කිරීම සඳහා රියදුරු වැටුප් හා දීමනා හැර කිලෝ මීටරයක් සඳහා රු. 28 ක් වැය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) ඉන්ධන දහනයවීම් පරීක්ෂා නොකිරීම**

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහනවල ඉන්ධන දහනයවීම පිළිබඳ පරීක්ෂාවන් සිදු කළ යුතුව තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය, කොත්මලේ, අඹගමුව හා වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු වාහන 12 ක ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් සිදු කර නොතිබුණි.

(ii) **වාහන අවභාවිතය**

2017 සැප්තැම්බර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ වාහන 04 ක දෛනික ධාවන සටහන් අනුව එම වාහනවල රාත්‍රී නැවතුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ලෙස සටහන් කර තිබුණද, අවස්ථා 50 කදී රාත්‍රී කාලයේදී එම වාහන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නවතා තිබුණු බව කාර්යාලයේ ආරක්ෂක අංශය විසින් පවත්වා තිබුණු ලේඛනවලින් තහවුරු වී නොතිබුණි.

(iii) **වාහන හා වාහනවල උපකරණ පිළිබඳ පූර්ණ සමීක්ෂණය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන 09 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 1647(ආ) ප්‍රකාරව 2018 ජුනි 17 දින වන විටත් වාහන හා ඒවායේ උපකරණ පිළිබඳ පූර්ණ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

**(ඈ) පිරිවැය හා කාර්යක්ෂමතාවයකින් තොරව වත්කම් අපහරණය කිරීම**

ප්‍රජා සංවර්ධන හා ජීවන මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ භාවිතා කරන ලද පරිගණක, උපාංග හා විදුලි උපකරණ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදීමේදී කිසිදු උපකරණයක් සම්බන්ධයෙන් අනුක්‍රමික අංකයක් (Serial No) ඉන්වෙන්ට්‍රි ලේඛනයෙහි සඳහන් කර නොතිබුණි. මෙම භාණ්ඩ තොග පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ලෙස භෞතික පරීක්ෂාවේදී

හඳුනා ගැනීමට නොහැකි ආකාරයට ඇතැම් භාණ්ඩ පමණක් ගබඩාවෙහි ගොඩ ගසා තිබුණි. භාණ්ඩ අළුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ විධිමත් පරිදි බැහැර කිරීමට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

**(ඉ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| | | රු. | වර්ෂ |
| • ගොඩනැගිලි | 02 | තක්සේරු කර නැත | 05 |
| • මෝටර් වාහන | 24 | -එම- | 10 |
| • යන්ත්‍ර සූත්‍ර | 02 | -එම- | 10 කට වැඩි |

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විවිධ අවස්ථාවල මිලදී ගත් පහත සඳහන් වත්කම් එක් අවස්ථාවක් හෝ ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

| වත්කම් වර්ගය | මිලදීගත් දිනය | වටිනාකම |
|---|---|---|
| | | රු. |
| • කොන්ක්‍රීට් හැමර් | 2015.12.08 | 216,450 |
| • මෝල්ඩර්ස් | 2015.12.08 | 25,200 |
| • ස්ලම්ප් පරීක්ෂණ උපකරණ | 2015.12. 08 | 9,500 |
| • දිග මැනීමේ උපකරණ | 2015.12.08 | 15,000 |
| • මට්ටම් ගැනීමේ උපකරණ | 2015.12.08 | 36,000 |
| • ICTAD ප්‍රකාශන | 2015.12.15 | 40,830 |

**(ඊ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව ප්‍රජා සංවර්ධන හා ජීවන මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ භාවිතා කරන ලද භාණ්ඩ පිළිබඳව 2015 දෙසැම්බර් 31 දිනෙන් පසු තොග සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(ii) 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් වෙන්දේසි කළ යුතු සහ ඉවත් කළ යුතු බව හඳුනා ගෙන 2016 මැයි 27 දින පැවැත්වූ වෙන්දේසියෙන් ඉවත් කරන ලද දිසාපති මැදුරට අයත් භාණ්ඩ වර්ග 20 ක් මුදල් රෙගුලාසි 772(3) ප්‍රකාරව තොග පොත්වලින් ඉවත් කර නොතිබුණි.

(iii) 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී දිසාපති නිල නිවසේ අතිරික්ත භාණ්ඩ ලෙස හඳුනාගෙන තිබුණු භාණ්ඩ වර්ග 21 ක් ද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අතිරික්ත භාණ්ඩ ලෙස හඳුනාගෙන තිබුණු භාණ්ඩ වර්ග 07 ක්ද, නිසි අනුමැතිය ලබා ගෙන පොත්වලට ඇතුළත් කර ගැනීමට 2018 අප්‍රේල් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**(උ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | වත්කම් වර්ගය | වත්කම් සංඛ්‍යාව/ඒකක ගණන/ප්‍රමාණය | වත්කම් ලබා දී ඇති ආයතනය | වටිනාකම | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|---|
| | | | | රු | වර්ෂ |
| (i) | ගොඩනැගිලි | 03 | නුවරඑළිය මහනගර සභාව | 19,550,000 | 01 |
| | | | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව. | තක්සේරු කර නැත. | 09 |
| | | | මහ බැංකුව | තක්සේරු කර නැත. | 02 |
| (ii) | මෝටර් වාහන | 03 | කාර්මික විද්‍යාලය බදුල්ල/නුවරඑළිය. | තක්සේරු කර නැත. | 01 |

**(ඌ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

වෙනත් ආයතන සතුව තිබුණු ඇතැම් වත්කම් විධිමත් අනුමැතියකින් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | වත්කම් වර්ගය | වත්කම් අයත්ව තිබුණු ආයතනය | සංඛ්‍යාව, ඒකක ගණන හෝ ප්‍රමාණය | වටිනාකම | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|---|
| | | | | රු. | වර්ෂ |
| (i) | ඉඩම් (හෙක්ටයාර) | මහවැලි අධිකාරිය | 1.495 | තක්සේරු කර නැත | 27 |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | මෝටර් වාහන | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන | 1 | තක්සේරු කර නැත | 03 |
| | | කෘෂිකර්ම අමාත්‍යාංශය | 1 | 2,000,000 | 14 |

**2.7 පාඩු හා හානි**

--------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක් විසින් මාර්ග ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී මාර්ග සම්මත රේට (HSR) යොදා ගැනීම වෙනුවට, ඒ සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේ රේට (BSR) යොදා ගැනීම නිසා කොන්ත්‍රාත් 198 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී රු.මිලියන 12.12 ක අධි ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. එම අධි ඇස්තමේන්තු වටිනාකමට අනුමත සමිති වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම නිසා එම ව්‍යාපෘති වෙනුවෙන් අධි ගෙවීම් සිදු කර තිබුණි.

(ආ) සමස්ථ ලංකා දහම් පාසල් සිසු නිපුණතා ඇගැයීමේ වැඩ සටහනේ 2017 දෙසැම්බර් 27 දින දිවා ආහාර සැපයීමේ වියදම පුද්ගලයින් දෙදෙනෙකු විසින් සිදු කර තිබුණත්, ඒ සඳහා රු.200,000 ක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි.

(ඇ) සමස්ථ ලංකා දහම් පාසල් සිසු නිපුණතා ඇගැයීමේ වැඩ සටහනේ 2017 දෙසැම්බර් 25 දින රාත්‍රී, 26 දින උදේ, දවල් හා රාත්‍රී සහ 27 දින උදේ ආහාර සැපයීම සඳහා අවශ්‍යව තිබුණු සමස්ථ ද්‍රව්‍ය ප්‍රමාණය මිලදී ගැනීම සඳහා රු.414,125ක් ඇස්තමේන්තු කර තිබුණි. නමුත් එම ආහාර සැපයීම සඳහා රු.618,202 ක් වැය කර ද්‍රව්‍ය මිලදී ගැනීම නිසා ඇස්තමේන්තුව ඉක්මවා රු.204,077 ක අධි ගෙවීමක් සිදු කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට වාහන අනතුරු 5 කට අදාළ එකතුව රු.මිලියන 1.88 ක අලාභයන් පැවැතුණි. එම අලාභයන් තුළ වර්ෂ 5 කට වැඩි කාලයක සිට රු. මිලියන 1.32 ක අලාභයන් පැවැත එමින් තිබුණත්, එම අලාභයන් අයකර ගැනීමට හෝ කපා හැරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපොහොසත් වී තිබුණි.

**2.8 විසඳා නොතිබුණු විගණන ඡේද**

-----------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව ඉකුත් වර්ෂවලට අදාළ විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
| --- | --- | --- |
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2016 | 3.2(ආ),(ඇ), (ඈ), (ඉ),(ඊ) | දිස්ත්‍රික්කයේ ඉදිකර තිබූ ව්‍යාපෘතිවල වැඩ අවසන් නොකිරීම, ඉදිකිරීම් භාවිතයට නොගැනීම, මහජනයාගේ ප්‍රයෝජනයට ගත හැකි පරිදි ඉදිකිරීම් අවසන් නොකිරීම. |
| 2016 | 3.2(එ) | කොන්ක්‍රීට් මිශ්‍රණය සඳහා නියමිත කැටගල් නොයෙදීම. |
| 2016 | 3.2(ඒ), (ඔ) | ඉදිකිරීම් සඳහා අධි ගෙවීම් සිදු කිරීම හා භෞතික පරීක්ෂාවට ලක් නොකර කාර්මික නිලධාරි කොන්ත්‍රාත් බිල්පත් ඉදිරිපත් කිරීම. |
| 2016 | 3.10(අ)(vi) | ප්‍රසම්පාදන ඉටු කිරීමේදි ජාතික තරඟකාරි ලංසු කැඳවීමට කටයුතු නොකිරීම. |
| 2015 | 3.10(ඉ) | අවිධිමත් ලෙස ව්‍යාපෘති ඉටු කර තිබුණු අවස්ථා |
| 2015 | 3.12.(iii) | ජාතික තරඟකාරි ලංසු කැඳවීමකින් තොරව වෙළෙඳපල සැසැඳුම් ක්‍රමය යොදා ගැනීම |
| 2014 | 3.4.2(ආ) | ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් නොමැති සමිතිවලට කොන්ත්‍රාත් පැවැරීම. |

## 2.9 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘති යටතේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කර්මාන්ත 09 ක් ඉදිකිරීම් සඳහා රු.මිලියන 13.00 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2017 දෙසැම්බර් 08 දින වන විටත් අදාළ කර්මාන්තයන්හි භෞතික ප්‍රගතිය සියයට 25 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ආ) 2017ජනවාරි 12 දිනැති අංක MWCA/WB/ග්‍රා.කා.සැ./2017 දරන ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශ අධ්‍යාක්ෂකගේ ලිපිය පරිදි සෑම ග්‍රාම නිලධාරි වසමකට කාන්තා කාර්යය සමාජ පිහිටුවිය යුතුව තිබුණි. කොත්මලේ හා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පවතින ග්‍රාම නිලධාරි වසම් 166 කින් වසම් 109 ක පමණක් කාන්තා කාර්යය සමාජ පිහිටුවා තිබුණි.

(ඇ) 2017ජනවාරි 12 දිනැති අංක MWCA/WB/ග්‍රා.කා.සැ 2017/.දරන ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ අධ්‍යාක්ෂකගේ ලිපියේ 4 ඡේදය අනුව කාන්තාවන්ගේ ගැටලු හඳුනාගෙන ඊට අදාළ විසඳුම්, රැකියා අවස්ථා, ව්‍යාපෘති සංඛ්‍යාව ඇතුළත් කරමින් 2018-2017 වර්ෂ සඳහා කාන්තා කාර්යය සමාජ සැලැස්ම පිළියෙල කර 2017ජනවාරි 31 දිනට පෙර ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණි. 2017 නොවැම්බර් 30 දින වන විටත් එම සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් විසින් මිලදී ගෙන තිබුණු භාණ්ඩ වර්ග 46 ක් අදාළ ප්‍රතිලාභීන් වෙත බෙදා හැරීමකින් තොරව 2018 පෙබරවාරි 28 දින වන විටත් ගබඩාවල රඳවා ගෙන තිබුණි.

(ඉ) වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ලියාපදිංචි ළමා සමාජ 125 කින් ළමා සමාජ 71 ක් පමණක් ක්‍රියාකාරී මට්ටමේ පැවැතුණි. එම ළමා සමාජ අතරින් ලමා සමාජ 11 ක් පමණක් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබුණි.

(ඊ) වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ කාන්තා සංවිධාන 107 ක් පවතින අතර ඉන් සංවිධාන 20 ක ලියාපදිංචි කටයුතු සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් පිළිබඳ දත්ත පද්ධතියට දත්ත එක්රැස් කිරීම සම්බන්ධයෙන් 2017 අප්‍රේල් 19 දිනැති අංක MWCA/04/01/07/2017-II දරන කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය අනුව 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාළ වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් පිළිබඳ දත්ත රැස්කිරීමේ කටයුතු 2017 ජූනි 30 දින වන විට අවසන් කළ යුතුව තිබුණි. නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2017 ඔක්තෝබර් 30 දින වන විට 2013 වර්ෂයට අදාළ දත්ත රැස්කිරීම අවසන් කර නොතිබුණි.

(ඌ) 2017 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිවිනැගුම ප්‍රජාමූල බැංකුවල ගිණුම් වර්ග 22 ක රු.මිලියන 71.80 ක බොල්ණය ශේෂ හා ගිණුම් වර්ග 17 කට අදාළව රු.මිලියන 45.74 ක කල් පසු වූ ණය පැවතුණි.

(එ) 2017 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිවිනැගුම ප්‍රජාමූල බැංකුවල රු.මිලියන 68.08 ක අක්‍රිය ගිණුම් ශේෂ පැවතුණි.

## 2.10 මහජනයා වෙත සේවා ඉටු කිරීම.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). ඉඩම් සම්බන්ධයෙන් තමන්ට පැන නැගී ඇති ගැටළු සහ සිදු වී ඇති අසාධාරණයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්වරයා වෙත 2016 වර්ෂයේ සිට මහජනතාව විසින් සිදු කරන ලද පැමිණිලි 105 ක් හා අනෙකුත් පැමිණිලි හා පෙත්සම් 37 ක් සම්බන්ධයෙන් විසඳුම් ලබා දීමට කටයුතු කර නොතිබුණි. පැමිණිල්ලක් සම්බන්ධයෙන් පැමිණිල්ල කළ දිනය, පැමිණිල්ල එවූ අය ගෙන ඇති පියවර හා තීරණය සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු සටහන් කර ලේඛනය විධිමත් පරිදි පවත්වා නොතිබුණි.

(ආ). වලපනේ හා නුවරඑළිය ප්‍රදේශීය ලේකම් කාර්යාල වෙත ලැබෙන මහජන පැමිණිලි සියල්ල ගොනුවක අමුණා තැබීම පමණක් සිදුකර තිබූ අතර, ඒ සම්බන්ධයෙන් කාර්යාලය විසින් ගත් ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 2.11 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ *දිස්ත්‍රික් ලේකම් කාර්යාලට* සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 340.88 | 328.86 | 12.02 | 3.53 |
| | මූලධන | 58.35 | 53.93 | 4.42 | 7.57 |
| | **එකතුව** | **399.23** | **382.79** | **16.44** | **4.11** |
| 2014 | පුනරාවර්තන | 378.65 | 332.25 | 46.40 | 12.25 |
| | මූලධන | 44.65 | 42.72 | 1.93 | 4.32 |
| | **එකතුව** | **423.30** | **374.97** | **48.33** | **11.42** |
| 2015 | පුනරාවර්තන | 435.30 | 423.75 | 11.55 | 2.65 |
| | මූලධන | 50.00 | 35.40 | 14.60 | 29.20 |
| | **එකතුව** | **485.30** | **459.15** | **26.15** | **5.38** |
| 2016 | පුනරාවර්තන | 447.00 | 439.65 | 7.35 | 1.64 |
| | මූලධන | 99.00 | 83.46 | 15.54 | 15.70 |
| | **එකතුව** | **546.00** | **523.12** | **22.88** | **4.19** |
| 2017 | පුනරාවර්තන | 440.86 | 436.40 | 4.46 | 1.01 |
| | මූලධන | 73.65 | 71.67 | 1.98 | 2.69 |
| | **එකතුව** | **514.51** | **508.07** | **6.44** | **1.25** |

**වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය කිරීම**

වෙනත් අමාත්‍යාංශ 25 ක්, දෙපාර්තමේන්තු 22 ක්, ජනාධිපති හා අගමැති කාර්යාල විසින් විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එකතුව රු.මිලියන 1,758.77 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 1,649.32 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 109.45 ක් හෙවත් සියයට 6.22 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක් තුළ ග්‍රාම නිලධාරි වසම් 491ක විවිධ සංවර්ධන වැඩසටහන් යටතේ සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති 1429 ක් අනුමත කර තිබුණි. ඒ සඳහා රු.මිලියන 606.36 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. 2017 දෙසැම්බර් 31 වනවිට එම ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 1404 ක් අවසන් කර තිබුණි. ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 5.61 ක් වූ ව්‍යාපෘති 10ක් අවලංගු කර තිබුණු අතර ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 9.71ක් වූ ව්‍යාපෘති 13ක ප්‍රගතිය සියයට 50කට වඩා අඩු මට්ටමක පැවතුණි. තවද, ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1.14 ක් වූ ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි.

(ආ) 2016 ජනවාරි 12 දිනැති අංක 1/2016 දරන සමාජ සවිබල ගැන්වීමේ හා සුභසාධන අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැඩිහිටි දීමනා හිමි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 5169 ක් වී තිබුණි. වර්ෂය මුළුල්ලේ එම සංඛ්‍යාව ස්ථාවරව පවත්වාගෙන යාම සඳහා ඉවත් වන නම් වෙනුවට ලේඛනයේ ඊළඟට සුදුසුකම් ලබා ඇති අය ඇතුළත් කළ යුතු වුවත්, එසේ කටයුතු නොකිරීම හේතුවෙන් වර්ෂය අවසාන වන විට රු.මිලියන 6.79 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ඇ) නුගවෙල ගම්මානයට පිවිසෙන මාර්ගයේ ආපදාවට ලක්ව ඇති ප්‍රදේශ සඳහා ආරක්ෂිත පැති බැම් හා කාණු පද්ධති සකස් කිරීමට කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රු.මිලියනයක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ආපදාවට ලක්වූ ස්ථානයේ බැම්මෙන් කොටසක් පමණක් ඉදිකර තිබුණි.

(ඈ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් රු.350,000ක ප්‍රතිපාදන මාවෙල කන්ද බානගල ඇළ ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණි. එම ප්‍රතිපාදන උපයෝජනය කර කර්මාන්තය නිම කර තිබුණි. අවහිර වී තිබුණු ඇළ මාර්ගය සකස් කරගෙන භාවිතයට ගැනීමට විගණිත දිනය වූ 2018 ජනවාරි 24 දින වන විටත් පියවර ගෙන නොතිබුණි. එම හේතුවෙන් කර්මාන්තයෙන් අපේක්ෂිත ප්‍රදේශයේ ජීවත්වන පුද්ගලයන්ගේ පානීය හා ගොවිතැන් සඳහා ජල අවශ්‍යතා සපුරාලීමේ අරමුණ ඉටු වී නොතිබුණි.

(ඉ) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ මාර්ග ව්‍යාපෘති 10 ක් කොන්ක්‍රීට් කිරීම වෙනු වෙන් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් වෙත රු.මිලියන 4.42 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මාර්ග ව්‍යාපෘති 1.2.4 මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් ගෙවීම් කර තිබුණද, ඒ සඳහා 19 mm කැටගල් වෙනුවට 25mm කැටගල් භාවිතා කර රු.733,319 ක අධි ගෙවීම් කර තිබුණි.

(ඊ) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ දිඹුල ෆොරස්ට්ක්‍රික් මාර්ගය ඉදිකිරීම වෙනුවෙන් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් රු.500,000ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණි. මාර්ගය 65.5 m ක ප්‍රමාණයක් ඉදිකළ බව ප්‍රකාශ කර රු.464,375 ක් ගෙවා තිබුණි. මාර්ගය භෞතික පරීක්ෂාවේදී 2018 ජනවාරි 19 දින වන විටත් 61 m ප්‍රමාණයක් පමණක් ඉදිකර තිබුණු අතර ඒ අනුව රු.20,182 ක අධි ගෙවීමක් කර තිබුණි. ඉදිකර තිබුණු 1x1 m කොටසක් පුපුරා තිබුණි.

(උ) විද්‍යාචක්‍ර විද්‍යාලයට යන මාර්ගය ඉදිකිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් රු.50,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම ප්‍රතිපාදනවලින් රු.491,734 ක් වැයකර මාර්ගය ඉදිකර තිබුණි. විගණන දිනය වූ 2018 ජනවාරි 17 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී එම මාර්ගයේ 10 m පමණ කොටසක 2' පමණ පළලකින් යුත් කොටසක් වැසි ජලයට සේදීයාමෙන් කොන්ක්‍රීට් තට්ටුව පමණක් ශේෂව පැවැතුණි. එම මාර්ග කොටසේ ඝනකම 4", 4 ½" හා 5" වශයෙන් වී තිබුණි. එබැවින් මෙම මාර්ගයේ ඝනකම නැවත පරීක්ෂා කළ යුතුව තිබුණි. මාර්ගය සෝදා පාලුවට ලක්වූ කොටසේ බැම් යෙදීමකින් තොරව කිසිදු වාහනයකට මාර්ගය ධාවනය සඳහා යොදාගත නොහැකිව පැවැතුණි.

(ඌ) දිඹුල පානීය ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් රු.මිලියන 1.30 ප්‍රතිපාදන සලසා තිබුණි. ඇස්තමේන්තුවේ සඳහන් රු.12,730

ක අත්‍යාවශ්‍ය අයිතම 03 ක් ඉටු කර නොතිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලුම් නොකළ රු.63,374 ක් බිල්පත් සංශෝධන කර ගෙවා තිබුණි. සංවර්ධන නිලධාරී වාර්තාවට අනුව කර්මාන්තයට නොයෙදූ ජලනළ සඳහා රු.287,820 ක් වැඩි පුර ගෙවා තිබුණි.

(එ) “වජිරපුර බුලුඇළ නිල සෙවන” ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් රු.මිලියන 1.50 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම ගොඩනැගිල්ල ඉදිකර තිබුණි. විගණන දිනය වූ 2018 ජනවාරි 16 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී කුලුනු ආසන්නයේ බිත්ති, කුලුනුවලින් වෙන්වී පුපුරා තිබුණි. තවද 16 mm ක් යෙදිය යුතු කපරාරුව 10mm හා ඊට අඩුව යෙදූ ස්ථාන පැවති අතර, මහියංගනය වැලි කර්මාන්තයට යොදා ගැනීම සඳහා ප්‍රවාහන ගාස්තු ගෙවා තිබුණද, බිත්තිවල කොටසක් සඳහා මඩ සහිත වැල්ලක් භාවිතා කර තිබුණි.

(ඒ) ශ්‍රී ධර්ම විජයාරාමය විහාරස්ථානයේ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධන කිරීමේ කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් රු.485,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම කර්මාන්තය 2017 ජූනි 20 දින නිම කර බිල්පත් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබුණි. කර්මාන්තයේ නිමාව සතුටුදායක මට්ටමක නොතිබුණු බව 2018 ජනවාරි 16 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. කොන්ක්‍රීට් කිරීම සඳහා රු.88,223 ක් ගෙවීම් කර තිබුණද, කොන්ක්‍රීට් නිසි පරිදි තැලීම් නොකිරීම නිසා මී වද දෝෂය (Hunny Comes) පැවති අවස්ථාද, කොන්ක්‍රීට් අතරින් කම්බි වාතයට නිරාවරණය වූ අවස්ථාද පැවතුණි. කොන්ක්‍රීට් මිශ්‍රණය දුර්වල තත්ත්වයේ විය.

(ඔ) ගොරඩිහෙළ ලයිසන් පාලම හා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් රු.මිලියන 1.48 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම කර්මාන්තය ඉටු කර තිබුණි. මාර්ගය මීටර් 120 දිගට සැකසීම (Earth Excavation), පොලිතීන් එළීම හා සැටලීම ගැසීම සිදු කර තිබුණද, මාර්ගයේ මීටර් 144.2 දුරට කොන්ක්‍රීට් යෙදූ බව සඳහන් කර ගෙවීම් කර තිබුණි. 2018 ජනවාරි 16 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී මාර්ගයේ දිග මීටර් 137.5 ක් වී තිබුණු අතර, එයින් මාර්ගයේ කොටසක ඝනකම 6 " නොවූ ස්ථාන ද පැවතුණු බව නිරීක්ෂණය විය. මාර්ගය කෙලවරේ රු.335,453 ක වියදමින් ඉදිකර තිබූ පාලමෙහි දෙපස බැම් හා පතුලේ කොන්ක්‍රීට් තට්ටුවෙහි නිමාව දුර්වල තත්ත්වයක පැවතුණි. පොළොව තුළ කොන්ක්‍රීට් තට්ටුව යොදා ඒ මත ඉදිකළ යුතු රැඳවුම් බැම්ම වෙනුවට පොළොවෙන් මතු පිට යොදා තිබුණු කොන්ක්‍රීට් තට්ටුව යටින් 2018 ජනවාරි 18 දින වන විටත් ජලයට සේදීමෙන් ඛාදනයට ලක්වී තිබුණි.

(ඕ) හෝල්බෲක් කෝවිල පාර සංවර්ධනය කිරීම සඳහා 2016 වර්ෂයේදී ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන සලසා තිබුණි. 2016 වර්ෂයේදී රු.451,827 ක් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වැය කර පාර සංවර්ධනය කර තිබුණි. නමුත් 2016 වර්ෂයේ ඉදිකළ කොටසේ ප්‍රසාරණ මූට්ටු ආසන්නයෙන් මාර්ගයේ ස්ථාන 07 ක් විගණන දිනය වූ 2018 ජනවාරි 16 දින වන විටත් පුපුරා තිබුණු බව නිරීක්ෂණය විය.

(ක) නාගසේන ට්‍රිල්කුට්ට්‍රී වතු මාර්ගය ඉදිකිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන සලසා තිබුණි. නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.මිලියන 1.50 ක ගිවිසුම්ගත වටිනාකමකට එම මාර්ගය ඉදිකර තිබුණි. 2018 ජනවාරි 19 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී ඉදිකළ මාර්ගයේ ස්ථාන 16 ක් මැදින් පුපුරා තිබුණි. මාර්ග පෘෂ්ඨය නිසි ලෙස සකස් කර නොතිබීම නිසා මාර්ගයේ මැද කොටසයෙහි ඝනකම 6 " ප්‍රමාණයක නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ග) බුළුඇළ කොළණියට යන මාර්ගයේ කාණු පද්ධතිය හා බෝක්කුව ඉදිකිරීමේ කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන සලසා තිබුණු අතර, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.495,000 ක් වැය කර එම කර්මාන්තය නිම කර තිබුණි. එමෙන්ම කර්මාන්තයට අදාළ කාණු පද්ධතියේ පතුල සඳහා 5" කට වඩා කොන්ක්‍රීට් තට්ටුවක් යෙදීමට රු.62,748 ක ඇස්තමේන්තු කර ගෙවීම් කර තිබුණි. නමුත් 6" ක ඝනකම 1.2.4 මිශ්‍රණයෙන් කාණුවේ පතුළ යොදා තිබුණත්, ඒ සඳහා තවත් 5" කට වඩා කොන්ක්‍රීට් තට්ටුවක් යෙදීමට වූ අවශ්‍යතාවය පිළිබඳ තහවුරු කරන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. කර්මාන්තය සම්බන්ධයෙන් සිදු කළ භෞතික පරීක්ෂාවේදී 2 " මඩ කොන්ක්‍රීට් තට්ටුවක් යොදා තිබුණු බව නිරීක්ෂණය වූ අතර, ඒ අනුව රු.39,143 ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි.

(ච) පීඩෲ වත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා කඳුරට නව ගම්මාන අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන සලසා තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.490,167 ක් වැය කර මාර්ගය සංවර්ධනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂාවේදී 1.2.4 මිශ්‍රණයෙන් මාර්ගය කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් ගෙවීම් කර තිබුණද, ඒ සඳහා 19 mm කැටගල් භාවිතා කර නොතිබුණි. ඒ අනුව රු.80,665 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ජ) ධර්මපුරම් කොළණියේ ජල ව්‍යාපෘති ඉදිකිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන සලසා තිබුණි. නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා රු.500,000 ක් වැය කර තිබුණි. නළ ළිඳක් ඉදිකර ජලය ලබාගැනීමට සැලැසුම් සකස් කර තිබුණත්, සලසා තිබුණු ප්‍රතිපාදනවලින් නල ළිඳ සඳහා පොළව විදුම්කර බට යොදා තිබුණි. තෙකලා විදුලිය ලබා ගැනීමට හා ජල මෝටරය ලබාගැනීම අවශ්‍ය ප්‍රතිපාදන ලබා දී නොතිබීම නිසා ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ට) මන්ත්‍රීතැන්න අතුරු මාර්ගය ඉතිරි කොටස සංවර්ධනය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් රු.500,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම මාර්ගය සංවර්ධනය කර තිබුණි. ඉදිකළ මාර්ගයේ කොටසක මීවද දෝෂ (Hunny Comes) පැවතුණි. මෙම ප්‍රදේශය හා මාර්ගය නායයන භූමි ප්‍රදේශයක ඉදිකර තිබූ බැවින්, මාර්ගයේ බෑවුම් ප්‍රදේශයේ රැඳවුම් බැම් යොදා නොතිබුණි.

(ඩ) සෙන්ට් රෙගියුලාස් සිට ග්ලැනිගල් කොටසට යන මාර්ගය ඉදිකිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන සලසා තිබුණි. නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.500,000 ක් වැයකර ඉදිකිරීම් වැඩ 2017 ජූලි 17 දින නිමකර තිබුණි. 2018 ජනවාරි 19 දින වන විට එම මාර්ගයේ ස්ථාන ගණනාවක් පලුදුවී තිබුණි.

(ණ) සමස්ථ ලංකා සිසු නිපුණතා ඇගැයීම් වැඩසටහනට සහභාගිවූවන්ගේ නවාතැන් සඳහා උණුවතුර ස්නානය කරන ස්ථාන සැකසීමේ කර්මාන්තය සඳහා රු.මිලියන 2.11 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම කර්මාන්තය වෙනුවෙන් උණුවතුර ෂවර් 65 ක් සවිකිරීමට ඇස්තමේන්තු කර තිබුණද, රු.මිලියන 1.29 ක් වැයකර ෂවර් 55 ක් පමණක් සවිකර තිබුණි. කර්මාන්තය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 61 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ත) සීතාඑළිය ගම හරහා දිවෙන ඇළ මාර්ගය පුළුල් කිරීමේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන සලසා තිබුණි. ක්ෂණික ජල ගැලීම්, ඉවුරු කඩා වැටීම හා ගංවතුර ආපදා තත්ත්වයන් අවම කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වී තිබුණි. මීටර් 77 ක කොටසක ඇළ මාර්ගය ඇස්තමේන්තුවේ පරිදි ඉදිකිරීම නිම කර තිබුණද, ප්‍රතිපාදන නොමැතිවීම නිසා ඇල මාර්ගයේ තවත් මීටර් 30 පමණ කොටසක් නිම කර නොතිබුණි. මේ නිසා ව්‍යාපෘතියෙන් අපේක්ෂා කළ අරමුණු ඉටු වී නොතිබුණි.

(ද) රෝස උයන අභ්‍යන්තර මාර්ගයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 2.66 ක් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වැය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ඉටුකිරීමෙන් මාර්ගය දිගේ ජලය හා රොන්මඩ ගලා යාම නිසා නිවාස යටවීම පාලනය කිරීමත්, මාර්ගය හා කාණු පද්ධතිය පිළිසකර කිරීමත් අරමුණ වී තිබුණි. ඒ අනුව නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාර්ගය කොන්ක්‍රීට් කිරීමට හා කාණු පද්ධතිය සැකසීමට රු.මිලියන 1.89 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. එම ඇස්තමේන්තුව බැහැර කරමින් රු.මිලියන 2.66 ක් වැයකර කාණු පද්ධතිය සකස් කිරීමකින් තොරව මාර්ගය කාපට් ඇතිරීම පමණක් සිදු කර තිබුණි. මේ නිසා ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

## 2.12 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 26001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 32.00 | 31.99 | 22.00 | 24.53 | 94.00 | 82.12 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ 2017 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.683,082 ක් වී තිබුණි. එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 01ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

**(ආ) කේවල ණය ශේෂ ලේඛන පිළියෙල නොකිරීම**

සැසඳුම් ප්‍රකාශයේ කේවල ශේෂ වර්ගීකරණය යටතේ සඳහන් වූ වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් තිදෙනෙකුගේ එකතුව රු.433,271 ක ණය ශේෂ වාරික අයකිරීමේ විස්තර සහ 2017 දෙසැම්බර් 31 දිනට ණය ශේෂ ණය ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ උත්සව අත්තිකාරම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු අතර රු.52,500 ක ණය වාරික අයකිරීම් සැසඳුම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

**2.13 අග්‍රිම ගිණුම**

--------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ අංක 7002/0000/00/0307/0017000 දරන අග්‍රිම ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 907,178 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 නොවැම්බර් 02 දිනැති අංක 04/2017 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2017 දෙසැම්බර් 31 දිනට මුදල් පොත තුලනය කර එහි ශේෂය පිළිබඳ සටහන් 2018 ජනවාරි 02 දින පෙර බැංකුවට භාරදී බැංකුව මඟින් හර නිවේදනයක් ලබාගෙන එය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ යුතුව තිබුණි. නමුත් එම හර නිවේදනය 2018 ජනවාරි 22 දින වන විටත් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ). 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කළ යුතුව තිබුණි. කොත්මලේ, අඹගමුව, වලපනේ, හඟුරන්කෙත හා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අවස්ථා 54 කදී නිකුත් කර තිබුණු තත්කාර්ය අතුරු අග්‍රිම දින 23 ක සිට දින 300 ක් දක්වා කාල පරාසයක් ප්‍රමාද කර අතුරු අග්‍රිම නිරවුල් කර තිබුණි.

(ඇ). මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම ලබා ගැනීම සඳහා වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කළ යුතු වුවද, අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එසේ වියදම් ඇස්තමේන්තුවක් ඉදිරිපත් නොකළ නිලධාරීන් වෙත අවස්ථා 2 කදී රු.50,000 බැගින් තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

**2.14 පොදු තැන්පත් ගිණුම්**

----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 05 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 330 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** වර්ෂ 2 ක් ඉක්මවූ රු.මිලියන 17.28 ක්වූ තැන්පතු 271 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 215(3) හි විධිවිධාන ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය ලබා නොගෙන හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වියදම් නොවූ රු. මිලියන 31.83 ක් වියදම් ලෙස ගිණුම්ගත කර එම මුදල පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**(ඇ)** වෙනත් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.753,582 ක් අවස්ථා 11 කදී අදාළ කාර්යභාරයන් ඉටු නොකර අඹගමුව, කොත්මලේ හා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පොදු තැන්පත් ගිණුම්වල රඳවා ගෙන තිබුණි.

(ඈ) 2012 මැයි 24 දිනැති අංක 4/3/1/2001/48 දරන ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සති 72 ක කාලයක් තුළ අවසන් කළ යුතුව තිබුණි. නමුත් විවිධ ව්‍යාපෘතීන් යටතේ ඉඩම් අත්කර ගැනීම සඳහා 2006 වර්ෂයේ සිට

2015 වර්ෂය දක්වා කාලය තුළ අවස්ථා 54 කදි නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලද රු.මිලියන 35.44 ක් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඉ) අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීම් කර්මාන්ත 96 ක් සඳහා 2014 සහ 2015 වර්ෂයන්හිදී රඳවා ගන්නා ලද රු.මිලියන 5.69 ක රැඳවුම් මුදල් නිදහස් කිරීමට හෝ රජයේ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.15 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර ,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | පුද්ගල පඩිනඩි ලේඛනය | මුදල් රෙගුලාසි 453 | වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |
| (ii) | ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය | මුදල් රෙගුලාසි 451 | හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (iii) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | ඇප ලේඛනයක් කොත්මලේ සහ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පිළියෙල කර නොතිබුණි. |
| (iv) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වලපනේ හා හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |
| (v) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) | වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (vi) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | හඟුරන්කෙත හා වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |
| (vii) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | හඟුරන්කෙත, අඹගමුව, කොත්මලේ, වලපනේ හා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් යාවත්කාලීන කර නොතිබුණි. |
| (viii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් යාවත්කාලීන කර නොතිබුණි. |

## 2.16 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) XIX වැනි පරිච්ඡේදයේ 4.3 වගන්තිය | - | කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පොදු සේවා හා උපලේඛන ගත නිවාස වෙන් කරවා ගැනීම සඳහා සම්මත ඉල්ලුම් පත්‍ර ආකෘතියක් භාවිතා කර දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එම ක්‍රමවේදය කාර්යාලයේ අනුගමනය කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | XIX වැනි පරිච්ඡේදයේ 4.3.4 වගන්තිය | - | කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ නිවාස ඉල්ලා ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත් සටහන් කිරීම සඳහා එක් එක් නිවාස ශ්‍රේණි අනුව වෙන වෙනම පොරොත්තු ලේඛන පවත්වා නොතිබුණි. |
| ( iii) | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5. 8 වගන්තිය | - | හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කර්යාලයේ රජයේ නිවාසවල පදිංචි නිලධාරීන්ගෙන් ඔවුන් විසින් පාවිච්චි කළ විදුලිය හා ජලය වෙනුවෙන් ගාස්තු අය කර ගෙන නොතිබුණි. |
| (iv) | XIX පරිච්ඡේදයේ 8 වන වගන්තිය | - | කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කර්යාලය පොදු හා උපලේඛනගත නිවාස සඳහා ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වා නොතිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

**--------------------------------**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 316 | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ උපපත්‍රිකා පොත් ගබඩාව තුළ අනාරක්ෂිතව තැන්පත් කර තිබුණි. |

**(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

**---------------------------**

| | |
|---|---|
| 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන චක්‍රලේඛය | වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් අංශයක් තුළ වර්ෂ 10 ක සිට වර්ෂ 15 ක් දක්වා දීර්ඝ කාලයක් නිලධාරීන් සේවයේ යොදවා තිබුණි. |

**(ඇ) 2016 ජනවාරි 12 දිනැති අංක 2016/1 දරන සමාජ සවිබල ගැන්වීමේ හා සුභසාධන අමාත්‍යාංශ චක්‍රලේඛයේ**

**------------------------------**

| | | | |
|---|---|---|---|
| (i) | 2.7 ඡේදය | - | හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වැඩිහිටි දීමනා ලබා නොගත් |

| | | | |
|---|---|---|---|
| | | | ප්‍රතිලාභීන්ගේ නම් රතු පැනකින් කපාහැර තිබුණත්, ඒ සඳහා කිසිදු හේතුවක් සඳහන් කර නොතිබුණි. |
| (ii) | 2.14 ඡේදය | - | හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාස 03 ක සිට වර්ෂයක් දක්වා දීමනාව ලබා නොගත් ප්‍රතිලාභීන් 80 කට අධික ප්‍රමාණයකගේ නම් ගෙවීම් ලේඛනයෙන් ඉවත් කර නොතිබුණි. |
| (iii) | 5.5 ඡේදය | - | වැඩිහිටි දීමනාව සෑම මසකම 15 වන දිනෙන් ආරම්භ වී වැඩකරන දින 07 ක් තුළ සෑම තැපැල්/ උප තැපැල් කාර්යාල හා දිවි නැඟුම බැංකු මඟින් ගෙවිය යුතු වුවත්, මාසිකව රුපියල් මිලියන 10 කට අධික වැඩිහිටි දීමනා ගෙවනු ලබන අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ප්‍රතිපාදන දින 15 සිට මාස 06 දක්වා ප්‍රමාද කර ලබාදී තිබුණි. |
| (iv) | 7.3 ඡේදය | - | අඹගමුව හා හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දින වන විට ප්‍රතිලාභීන් පිළිබඳව නැවත සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |

**(ඉ) 2016 අප්‍රේල් 11 දිනැති කාන්තා හා ළමා කටයුතු ලේකම්ගේ අංක 2016/06 දරන චක්‍රලේඛය**

| | | | |
|---|---|---|---|
| (i) | 11.5 ඡේදය | 4,578,000 | අවස්ථා 06 කදී නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෝෂණ මල්ල වැඩ සටහනේ බිල්පත් මාස 01 ක සිට මාස 05 ක් දක්වා කාල ප්‍රමාදයක් සිදුකර තිබුණි. |
| (ii) | 14.4 ඡේදය | - | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2017 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා පෝෂණ මල්ල වැඩ සටහනේ ප්‍රගතිය පිළිබඳව වාර්තා ඉදිරිපත් කිරීම, දින 03 ක සිට දින 79 ක් දක්වා පරාසයක කාල පමාවක් සිදු කර වාර්තා ඉදිරිපත් කර තිබුණි. |

| | |
|---|---|
| **(ඊ) 2016 දෙසැම්බර් 23 දිනැති අංක ත සං/සං/2-11/15/60 දරන ජාතික තරුණ සේවා සභා අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.9 ඡේදය** | 2017 මාර්තු 10 දින වන විට නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම නිලධාරි වසම් 08 ක යෞවන සමාජ පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. |
| **(උ) 2017 ජනවාරි 12 දිනැති අංක MWCA/WB/ග්‍රා.කා.සැ./2017 දරන ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශ අධ්‍යක්ෂගේ ලිපිය** | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පවතින ග්‍රාම නිලධාරි වසම් 72 කින් වසම් 56 ක පමණක් කාන්තා කාර්යය සමාජ පිහිටුවා තිබුණි. |

**2.17 අභ්‍යන්තර විගණනය**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාරව මුදල් කටයුතුවලට අදාළ අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කර තිබුණත්, එමගින් කාර්යාලයේ සියළුම කටයුතු ආවරණය වී නොතිබුණි.

(ආ). මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.18 මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 379.3 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.327,837 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 35 | 25 | 10 | - |
| (ii) | තෘතියික මට්ටම | 20 | 09 | 11 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1305 | 1050 | 255 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 90 | 71 | 19 | - |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | - | 2 | - | 2 |
| | **එකතුව** | **1450** | **1157** | **295** | **2** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

**--------------------------------------------------------------------**

2014 නොවැම්බර් 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි කාර්යාල සේවක සේවයේ නිලධාරියකු ලෙස පත්වීමක් ලබා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත කර තිබුණු නිලධාරියකු 2015 අප්‍රේල් 08 දින සිට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ආවරණ අනුමැතියට යටත්ව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර තිබුණි. 2018 අප්‍රේල් 04 දින වන විටත් අනුමැතිය ලැබී නොතිබුණි.

**(ආ) කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක 1157 ක්වූ කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණත්, 2017 වර්ෂය තුළ නිලධාරීන් 239 දෙනෙකු සඳහා පමණක් පුහුණුවීම් ලබා දී තිබුණි. ඒ අනුව නිලධාරින් 918 කට කිසිඳු පුහුණුවක් ලබාදී නොතිබුණි.

(ii) පසුගිය වර්ෂ 5 ක් තුළ පුහුණු කිරීම් කටයුතු සඳහා සලසා තිබුණු රු.මිලියන 6.45 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 5.82 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂ 05 ක කාලය තුළ නිලධාරි පුහුණු කටයුතු සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන පූර්ණ වශයෙන් උපයෝජනයක් කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 1 ක සිට සියයට 27 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.